සැ. යු. - (i) 2014.04.04 වැනි දින පළවූ අංක 1,857 දරන ගැසට් පත්‍රයේ I:III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,858 - 2014 අප්‍රේල් මස 11 වැනි සිකුරාදා - 2014.04.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 280 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 283 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 283 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | — |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 285 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 මැයි මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 අප්‍රේල් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


279– B 080828—300 (2014/04)

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2014 අංක 240

MOD/DEF/03/02/PRO/RNF/03/01.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2013 ජනවාරි මස 1 වැනි දින සිට තාවකාලික කපිතාන් වශයෙන් :*

කොමාණ්ඩර් (ඉ) කදවින්න මුදියන්සේලාගේ වසන්ත කුමාර කදවින්න, පීඑස්සී ශ්‍රීලංනාහ - එන්ආර්ඊ 0647
වෛද්‍ය කොමාණ්ඩර් මානික බදුගේ ප්‍රභාත් චින්තක විජේදාස ශ්‍රීලංනාහ එන්ආර්එම් 0851

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

04-360

2014 අංක 241

MOD/DEF/03/02/VNF/PRO.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්

*2012 ජූලි මස 1 වැනි සිට කොමාණ්ඩර් (ස්වේ) වශයෙන් :*

ලුතිතන් කොමාණ්ඩර් (තාවකාලික කොමාණ්ඩර්) දොඩංගොඩ ආරච්චිගේ ලයනල් ගුණරත්න - ශ්‍රීලංස්වේනාහ, එන්වීඑක්ස් 5164

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

04-362/1

2014 අංක 242

MOD/DEF/03/02/VNF/PRO.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2012 නොවැම්බර් මස 30 වැනි දින සිට ලුතිතන් කොමාණ්ඩර් (ස්වේච්ඡා) වශයෙන් :*

ලුතිතන් (ස්වේච්ඡා) දිසානායක මුදියන්සේලාගේ නිලන්ත දිසානායක, එන්වීඑක්ස් 5331, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 පෙබරවාරි මස 09 වැනි දින,
කොළඹ දී ය.

04-362/2

2014 අංක 243

MOD/DEF/03/02/PRO/RNF/01.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2011 පෙබරවාරි මස 25 වැනි දින සිට තාවකාලික ලුතිතන් කොමාණ්ඩර් (නාසෙ) වශයෙන් :*

ලුතිතන් (නාසෙ) නයිවලරාලලාගේ ප්‍රගීත් මධුරංග, එන්ආර්පී 1423 ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2012 පෙබරවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.

04-361/2

2014 අංක 244

MOD/DEF/03/02/PRO/RNF/01.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2011 අප්‍රේල් මස 23 වැනි දින සිට තාවකාලික ලුතිතන් කොමාණ්ඩර් (නාසෙ) වශයෙන් ඃ*

ලුතිතන් (නාසෙ) ආරච්චිල්ලාගේ අසිත නවරත්න බණ්ඩා, එන්ආර්පී 1426, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 ජනවාරි මස 07 වැනි දින,
කොළඹ දී ය.

04-361/1

---

2014 අංක 245

MOD/DEF/10/03/PRO/ST.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික එයාර් වයිෂ් මාර්ෂල් නිලයට උසස් කෙරේ.

එයාර් කොමඩෝර් ක්‍රිසන්තස් රනිල් ගුරුසිංහ (01365) නි. පො. රා. 2012.05.01

එයාර් කොමඩෝර් ලොකුගන් හේවගේ අජන්ත සිල්වා (01382) කාර්/ඉංජි 2012.06.01

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 ජුනි මස 14 වැනි දින,
කොළඹ දී ය.

04-280

---

2014 අංක 246

MOD/DEF/10/03/PRO/03.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම් සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර ගෲප් කැප්ටන් නිලයට උසස් කෙරේ.

තාවකාලික ගෲප් කැප්ටන් විජේන්ද්‍ර ප්‍රසන්න බාලසූරිය (01597) පරිපාලන 2011.10.02

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2011 දෙසැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

04-281

---

2014 අංක 247

MOD/DEF/10/03/PRO/02.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම් සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර විං කමාන්ඩර් නිලයට උසස් කෙරේ.

තාවකාලික විං කමාන්ඩර් හේරත් මුදියන්සේලාගේ මහසෙන් සෙනරත් බණ්ඩාර හේරත් (01741) සැපයුම් 2011.01.03

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2011 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

04-358/1

2014 අංක 248

MOD/DEF/10/03/PRO/02.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම් සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර විං කමාන්ඩර් නිලයට උසස් කෙරේ.

තාවකාලික විං කමාන්ඩර් උපුල් සංජා ලොරෙන්සු තොටහේවගේ (01972) කාර්මික/ඉංජිනේරු 2012.11.14

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 ඔක්තෝබර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

04-358/2

2014 අංක 249

MOD/DEF/10/03/PRO/IT.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම් සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික ස්කොඩ්රන් ලීඩර් නිලයට උසස් කෙරේ.

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් මාරසිංහ මුදියන්සේලාගේ ප්‍රසාද් මාලින්ද මාරසිංහ (02472) පරිපාලන/රෙජි 2012.01.09

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 ජූලි මස 07 වැනි දින,

04-359/1

---

2014 අංක 250

MOD/DEF/10/03/PRO/01T.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික ස්කොඩ්රන් ලීඩර් නිලයට උසස් කෙරේ.

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් මද්දුම දොඩන්ගොඩගේ අශාන් දොඩන්ගොඩ (02430) නි.පො.රා. 2012.11.28
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් සේනාරත්න මුදියන්සේලාගේ නිසංග දිල්සාන් සේනාරත්න (02682) කාර්මික/ඉංජි 2012.11.28

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 ඔක්තෝබර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

04-359/2

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2014 අංක 251

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

නෙලුමානි දවුලගල මහත්මිය 2013 දෙසැම්බර් මස 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්,

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

04-248/1

2014 අංක 252

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ශ්‍රී ලංකා තක්සේරු සේවයේ I පන්තියේ ඊ. දයාසේන මහතා 2014 ජනවාරි මස 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු වශයෙන්

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

04-248/2

2014 අංක 253

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත් වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ 1 ශ්‍රේණියේ අනුලා හරස්ගම මහත්මිය 2013 දෙසැම්බර් මස 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්,

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි

04-248/3

# වෙනත් පත්කිරීම් ආදිය

2014 අංක 254

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පත්කිරීම්**

1. ශ්‍රී. ලං. ප. සේ විශේෂ ශ්‍රේණියේ එස්. එස්. හෙට්ටිආරච්චි මහතා, 2013.07.16 දින සිට නැවත නියමයක් කරන තුරු මැතිවරණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් වශයෙන්

2. ශ්‍රී. ලං. ප. සේ I පන්තියේ යූ. කේ. බණ්ඩාර මහතා, 2013.07.01 දින සිට නැවත නියමයක් කරන තුරු ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) වශයෙන්

3. ශ්‍රී. ලං. ප. සේ විශේෂ ශ්‍රේණියේ කේ. පී. බී. වී. සිල්වා මහතා, 2013.03.05 දින සිට නැවත නියමයක් කරන තුරු ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන හා මුදල්) වශයෙන්

4. ශ්‍රී. ලං. ප. සේ I පන්තියේ ජී. එස්. කේ. කන්නන්ගර මහතා, 2012.01.02 දින සිට නැවත නියමයක් කරන තුරු ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ ජනකලා කේන්ද්‍රයේ අධ්‍යක්ෂ වශයෙන්

5. ශ්‍රී. ලං. ප. සේ III පන්තියේ ඩබ්. එම්. ටී. ඩී. කේ. වීරකෝන් 2013.01.24 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්වධන වැඩබලන නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු වශයෙන්

6. ශ්‍රී. ලං. ප. සේ I පන්තියේ ඩී. එම්. පී. ජයවර්ධන මහතා, 2013.02.18 දින සිට නැවත නියමයක් කරන තුරු බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ බෞද්ධ කටයුතු කොමසාරිස් (මහනුවර) වශයෙන්

7. ශ්‍රී. ලං. ප. සේ I පන්තියේ එච්. එන්. කුමාරි මහත්මිය, 2013.02.11 දින සිට නැවත නියමයක් කරන තුරු බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ බෞද්ධ කටයුතු කොමසාරිස් (දහම් පාසල්) වශයෙන්

8. ශ්‍රී. ලං. ප. සේ. විශේෂ ශ්‍රේණියේ තනූජා මුරුගේෂන් මහත්මිය, 2012.08.02 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) වශයෙන්

9. ශ්‍රී. ලං. ප. සේ I පන්තියේ එච්. එන්. එන්. ගුණසේකර මහත්මිය, 2013.01.10 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (බිම් සවිය) වශයෙන්

10. ශ්‍රී. ලං. ප. සේ I පන්තියේ එන්. බී. අයි. නානායක්කාර මහත්මිය, 2011.01.20 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (බිම් අත්පත්) වශයෙන්

11. ශ්‍රී. ලං. ප. සේ I පන්තියේ පී. ඩී. එල්. ගුණරත්න මහතා, 2013.02.05 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ඉඩම් ප්‍රතිපත්ති) වශයෙන්

12. ශ්‍රී. ලං. ප. සේ III පන්තියේ එල්. ඩබ්. එස්. සී. නවරත්න මහත්මිය, 2010.02.01 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් හා ඉඩම්

සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (ඉඩම් අත්පත්) වශයෙන්

13. ශ්‍රී. ලං. ප. සේ III පන්තියේ එම්. එන්. එස්. රියාසා මෙනවිය, 2011.12.15 දින සිට නැවන නියමයක් කරන තුරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර ලේකම් (පාලන) වශයෙන්

14. ශ්‍රී. ලං. ප. සේ III පන්තියේ යූ. කේ. ඩී. මහේෂිකා තිලානි මහත්මිය, 2011.12.15 දින සිට නැවන නියමයක් කරන තුරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර ලේකම් (ඉඩම්) වශයෙන්

15. ශ්‍රී. ලං. ප. සේ III පන්තියේ එම්. ඒ. එල්. ඩී. කුමාරි මෙනවිය, 2012.09.24 දින සිට නැවන නියමයක් කරන තුරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර ලේකම් (පාලන) වශයෙන්

16. ශ්‍රී. ලං. ප. සේ III පන්තියේ ඒ. එම්. කේ. සමරදිවාකර මෙනවිය, 2012.09.24 දින සිට නැවන නියමයක් කරන තුරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (ඉඩම් ප්‍රතිපත්ති) වශයෙන්

17. ශ්‍රී. ලං. ප. සේ III පන්තියේ ඒ. ඩී. පී. එන්. ආරිගල මෙනවිය, 2012.09.24 දින සිට නැවන නියමයක් කරන තුරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර ලේකම් (බිම් සවිය) වශයෙන්

18. ශ්‍රී. ලං. ප. සේ I පන්තියේ කේ. ආර්. පත්මප්‍රිය මහතා, 2013.07.01 දින සිට නැවන නියමයක් කරන තුරු විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන්

19. ශ්‍රී. ලං. ප. සේ III පන්තියේ ඒ. එස්. ජේ. පී. අතුකෝරළ මෙනවිය, 2013.09.05 දින සිට නැවන නියමයක් කරන තුරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (උපාය මාර්ගික) වශයෙන්

20. ශ්‍රී. ලං. ප. සේ. විශේෂ ශ්‍රේණියේ ඩබ්. එම්. ආර්. පී. වීරසිංහ මහතා, 2013.09.23 දින සිට නැවන නියමයක් කරන තුරු ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) වශයෙන්

21. ශ්‍රී. ලං. ප. සේ I පන්තියේ එම්. කේ. එස්. ශීරන්ති මහත්මිය, 2013.10.07 දින සිට නැවන නියමයක් කරන තුරු පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන්

22. ශ්‍රී. ලං. ප. සේ I පන්තියේ ජේ. ඒ. එස්. රවීන්ද්‍ර මහතා, 2013.08.14 දින සිට නැවන නියමයක් කරන තුරු ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ වශයෙන්

23. ශ්‍රී. ලං. ප. සේ III පන්තියේ ජේ. ඒ. ජේ. එස්. සී. ජයසිංහ මහත්මිය, 2012.09.25 දින සිට නැවන නියමයක් කරන තුරු ප්‍රවාහන අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්

24. ශ්‍රී. ලං. ප. සේ I පන්තියේ නිශ්ශංක පතිරාජගේ විජිත චන්ද්‍ර පියතිලක මහතා, 2013.09.04 දින සිට නැවන නියමයක් කරන තුරු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) වශයෙන්

25. ශ්‍රී. ලං. ප. සේ I පන්තියේ මානෙල් ශ්‍රියාලතා කපුකොටුව මහත්මිය, 2013.07.02 දින සිට නැවන නියමයක් කරන තුරු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පාලන) වශයෙන්

26. ශ්‍රී. ලං. ප. සේ I පන්තියේ ඩබ්. එම්. චන්ද්‍රසිරි මහතා, 2013.10.28 දින සිට නැවන නියමයක් කරන තුරු රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ අධ්‍යක්ෂ (සංවර්ධන) වශයෙන්

27. ශ්‍රී. ලං. ප. සේ. විශේෂ ශ්‍රේණියේ ආර්. එස්. එම්. වී. සෙනෙවිරත්න මහත්මිය, 2013.11.01 දින සිට නැවන නියමයක් කරන තුරු දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) වශයෙන්

28. ශ්‍රී. ලං. ප. සේ. විශේෂ ශ්‍රේණියේ සී. එච්. කුරුකුලආරච්චි මහත්මිය, 2012.03.02 දින සිට නැවන නියමයක් කරන තුරු සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පරිපාලන)) වශයෙන්

29. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ එච්. ඩී. ඩී. සී. පී. කේ. තිලකරත්න මහත්මිය, 2013.09.30 දින සිට නැවන නියමයක් කරන තුරු සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) වශයෙන්

30. ශ්‍රී. ලං. ප. සේ. I පන්තියේ බී. එල්. ඒ. ජේ. ධර්මකීර්ති මහතා, 2013.11.07 දින සිට නැවන නියමයක් කරන තුරු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පාලන) වශයෙන්

31. ශ්‍රී. ලං. ප. සේ. විශේෂ ශ්‍රේණියේ එච්. පී. දයා මැණිකේ සරත්චන්ද්‍ර මහත්මිය, 2012.05.28 දින සිට නැවන නියමයක් කරන තුරු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) වශයෙන්

32. ශ්‍රී. ලං. ප. සේ. I පන්තියේ කේ. ජී. උපාලි රණවක මහතා, 2012.05.28 දින සිට නැවන නියමයක් කරන තුරු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පාලන) වශයෙන්

33. ශ්‍රී. ලං. ප. සේ. II පන්තියේ පී. වී. එම්. එස්. බී. උඩෝවිට මහතා, 2011.03.03 දින සිට නැවන නියමයක් කරන තුරු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) වශයෙන්

34. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ආර්. ඒ. ඩී. ටී. එන්. තෙන්නකෝන් මහත්මිය, 2013.03.22 දින සිට නැවන නියමයක් කරන තුරු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (පාලන) වශයෙන්

35. ශ්‍රී. ලං. ප. සේ. I පන්තියේ ඩබ්. ඒ. ඩී. යූ. වී. නිශ්ශංක මහතා, 2014.01.07 දින සිට නැවන නියමයක් කරන තුරු පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් (සංවර්ධන හා පර්යේෂණ) වශයෙන්

36. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ කේ. ජී. අයි. එස්. ගාල්ලගේ මහත්මිය, 2014.01.20 දින සිට නැවන නියමයක් කරන තුරු අග්‍රාමාත්‍ය කාර්යාලයේ සහකාර ලේකම් වශයෙන්

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2014 මාර්තු මස 24 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

04-391

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

එම්. එස්. එම්. ෂිල්මි,
ගිණුම් අංක : 0139 5000 0869

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2014 ජනවාරි මස 30 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී හෝල්ඩින් කොම්පැණි නමින් මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් වී. වී. ඉන්ද්‍රන් යන අය විසින් ලියා සහතික කරන ලද 2012 මැයි 02 දාතම හා අංක 16791 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මොහමඩ් සලීම් මොහමඩ් ෂිල්මි යන අය බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 16791 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් එක් කෝටි අසූ අට ලක්ෂ දහසය දහස් තුන්සිය එකයි ශත තිස් හතක (රු. 18,816,301.37) මුදලක් 2014 ජනවාරි 20 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක් කෝටි අසූ අට ලක්ෂ දහසය දහස් තුන්සිය එකයි ශත තිස් හතක (රු. 18,816,301.37) මුදල ද 2014 ජනවාරි මස 21 වැනි දින සිට අංක 16791 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටියක (රු. 10,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) හා තවත් රුපියල් හැත්තෑ පන් ලක්ෂයක (රු. 7,500,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 16791 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතුය යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### ඉහත කී උපලේඛනය

ශ්‍රී ලංකා ජනරජයේ නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ මාන්මුනායි පත්තුවේ මාන්මුනායි පත්තු ප්‍රාදේශීය සභා සීමාවන් තුළ තලංකුඩා ග්‍රාමයේ පිහිටි "පෙරියතෙන්තෝට්ටම් සහ සින්නතෙන්නත් තෝට්ටම්" යයි කියනු ලබන ඉඩම් කොටසේ දකුණු කොටසේ උතුරු කොටසට බලයලත් මානක තැන ඒ. ඊ. කේ. තිස්සවීරසිංහ යන අය විසින් සාදන ලද 2012.01.21 වැනි දින මනින ලද පිඹුරු අංක 068/2012 හි ලොට් 1 සහ 2 වශයෙන් නිරූපිත සහ නැවත මනින ලද ප්‍රමාණයෙන් උතුරට බඹ 237ක් දකුණට බඹ 181 1/2ක් නැගෙනහිරට : බඹ 45ක් සහ බස්නාහිරට බඹ 75 1/2ක් අඩංගු කොටසට සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ප්‍රමාණයෙන් අක්කර දහයයි රූඩ් තුනයි පර්චස් දහ අටයි දශම හතයි දෙකක් (අ. 10 රූඩ් 3 පර්. 18.72) හෝ හෙක්ටයාර් 04.3977ක් විශාල ඉඩම් කොටස මායිම්, නැගෙනහිරට : මාන්මුනායි තොටුපල පාර බස්නාහිරට : රජයේ ඉඩම වර්තමානයේ ඇළ උතුරට : මොහමඩ් හසීම් යන අයට අයිති මෙහි අනෙක් කොටස සහ දකුණට : යූ. යොහාරා උම්මා යන අය විසින් වර්තමානයේ හිමිකම් කියනු ලබන ඉඩම සමග පස, සහ එහි පිහිටි සෑම සියලු දේ හා සෑම අයිතියක් ද අනෙකුත් සියලුම අයිතීන් ද සමග වෙළුම බී 322 පත්‍රිරුව 54 යටතේ මඩකලපුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

04-396

---

## කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ගිණුම් අංක : 1720013431.
ණය ගිණුම් අංක : 994883 සහ 1123240.
මොහොමඩ් සලීම් මොහොමඩ් ජෆර්.

2014 ජනවාරි මස 31 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරනු ලබයි.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ඩබ්. එම්. එම්. එම්. එස්. අමරකෝන් විසින් 2011 නොවැම්බර් මස 01 වැනි දින සහතික කරන ලද අංක 594 සහ 2012 පෙබරවාරි මස 17 වැනි දින සහතික කරන ලද අංක 650 දරන දැන් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මොහොමඩ් සලීම් මොහොමඩ් ජෆර් විසින් තනි අයිතිකාර ව්‍යාපාරයක් වශයෙන් පවත්වාගෙන යනු ලබන මිල්කි ටෙක්ස්ටයිල්ස් ණයකරු හැටියට පැහැරහැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි අසූහත්ලක්ෂ හැත්තෑ හතරදහස් දෙසිය තිස් හතරයි ශත තිස්එක (රු. 18,774,234.31) ක මුදලක් 2013 නොවැම්බර් මස 25 වැනි දින වන විට කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එක්කෝටි අසූහත්ලක්ෂ හැත්තෑහතරදහස් දෙසිය තිස් හතරයි ශත තිස්එක (රු. 1,87,74,234.31) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 නොවැම්බර් මස 26 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 74,63,051.68කමුදල මත 24% සහ රු. 95,66,660 ක මුදල මත 14% වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 594 සහ 650 දරන

බැඳුම්කරයන් යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස්කොට ඇත්තාවූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍ර කොළඹ 12 හල්ෆ්ඩ්‍රොප් විදියේ අංක 182 හි 3 වන මහලේ ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් පී. එල්. සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ පෑලියගොඩ නගර සභා සීමාවේ පෑලියගොඩ පැලැන්වත්ත ස්වස්තික ගාඩින්ස් හි වරිපනම් අංක 20 සහ 22 දරන මල්වත්තමුල්ලේ කුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ආර්. ද සිල්වා විසින් 2009 ඔක්තෝබර් මස 22 වැනි දින සාදන ලද අංක 3784 දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : (අඩි 30ක් පළල) ස්වස්තික ගාඩින්ස් පාර සහ අංක 903 දරන පිඹුරේ ලොට් 39 ද, නැගෙනහිරට : ඩී. ජේ. හරමානිස් සහ තවත් අයට අයිති දේපළ (ටී. පී. 80824 හි කොටසක්) ද, දකුණට : ඩී. ජේ. හරමානිස් සහ තවත් අයට අයිති දේපළ (ටී. පී. 80824 හි කොටසක්) සහ අංක 903 දරන පිඹුරේ ලොට් 42 ද, සහ බස්නාහිරට : අංක 903 දරන පිඹුරේ ලොට් 42 සහ අඩි 30ක් පළල ස්වස්තික උද්‍යානය පාරෙන් මායිම් වූ එකී අංක 3784 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිහයි දශම පහයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 30.50) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වන මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව බී 1063/151 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් මාර්ග ඔස්සේ ගමන් කිරීම ජලනල එළීම සඳහා අගල් කැපීම මතුපිටින් සහ පොළොව යටින් විදුලිය රැහැන් ඇදීම ආදිය සඳහා ඇති අයිතිය සමග වේ.

1. ඉහත සඳහන් පෑලියගොඩ පිහිටි 1971 ජුනි 30 වැනි දින සාදන ලද අංක 903 දරන පිඹුරේ ලොට් ආර් 1 (අඩි 30ක් පළල පාරක් සඳහා වෙන්කිරීම) සහ මල්වත්තමුල්ලකුඹුර බෙදා වෙන්කොට බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග විසින් 1971 ජූලි 02 වැනි දින සාදන ලද එම පිඹුරු අංකයට සහිත පිඹුරේ සඳහන් ඉඩමට මායිම් වශයෙන් උතුරට : ලොට් 1 සිට 18 දක්වා, නැගෙනහිරට : ලොට් ආර් 3 (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන්කිරීම) ද, දකුණට : ලොට් 32 සිට 46 දක්වා ආර් 2 සහ ලොට් 49 සිට 51 දක්වා සහ බස්නාහිරට : පාර පිඹුරු අංක 903 ට අනුව පර්චස් එකයි දශම හතයි පහ (අ. 0, රූ. 0, පර්. 1.75) විශාලත්වයෙන් වූ මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම/පත්ඉරුව බී 566/137 යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත සඳහන් පෑලියගොඩ පිහිටි මල්වත්තේ කුඹුර බෙදා වෙන් කොට ලොට් ආර් 3 වශයෙන් දැක්වෙන (අඩි 20 පාරක් සඳහා වෙන්කිරීම) කොටසට බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග විසින් 1971 ජුනි 30 දින සහ 1971 ජූලි 02 දිනෙන් සාදන ලද පිඹුරු අංක 903 ට එම ආර් 3 දරන ඉඩම් කැබැල්ල මායිම් වශයෙන් උතුරට : පිඹුරු අංක 151 හි සඳහන් ලොට් 2 ද, නැගෙනහිරට : ලොට් ආර් 4 19 සහ 27 සිට 30 දක්වා ද, දකුණට : ලොට් 31 ද, බස්නාහිරට : ලොට් 32, ආර් 1 සහ 18 පිඹුරු අංක 903 ට අනුව පර්චස් දහයයි දශම එකයි නමය (අ. 0, රූ. 0, පර්. 10.19) ක විශාලත්වයෙන් වූ මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව බී 566/138 යටතේ ලියාපදිංචි කර ඇත.

3. ඉහත සඳහන් පෑලියගොඩ පිහිටි මල්වත්තමුල්ලේකුඹුර ඉඩම බෙදා වෙන්කොට බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග විසින් 1971 ජුනි 30 වැනි දින සහ 1971 ජූලි 02 දිනෙන් සාදන ලද පිඹුරු අංක 903 ට එම ආර් 4 (පාරක් සඳහා වෙන්කිරීම) දරන ඉඩම් කැබැල්ලට මායිම් වශයෙන් උතුරට : පිඹුරු අංක 151 හි සඳහන් ලොට් 2 ද, නැගෙනහිරට : නුගේ පාර ද, දකුණට : ලොට් 20 සහ 19 ද සහ බස්නාහිරට : ලොට් ආර් 3 එම පිඹුරු අංක 903 ට අනුව පර්චස් හතයි දශම පහයි හය (අ. 0, රූ. 0, පර්. 7.56) ක විශාලත්වයෙන් වූ මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව බී 566/139 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

04-387

---

### කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ගිණුම අංක : 1410219301.
ණය ගිණුම් අංක : 320862, 762717 සහ 762722.
අයි. ඊ. ටෙක්නික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2014 පෙබරවාරි මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් යූ. ඩී. පියසේන විසින් 1997 නොවැම්බර් මස 12 වැනි දින සහතික කරන ලද අංක 523, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. එල්. වික්‍රමආරච්චි විසින් 2002 අප්‍රේල් මස 12 වැනි දින සහතික කරන ලද අංක 5908 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එල්. ජයවීර විසින් 2007 දෙසැම්බර් මස 18 වැනි දින සහතික කරන ලද අංක 2656 දරන බැඳුම්කර මගින් දැන් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දාවූ ද බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පානදුර ගුණරතන මාවතේ අංක 3 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව ස්ථාපිත සමාගමක් වූ අයි. ඊ. ටෙක්නික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් හයකෝටි හතලිස්හත්ලක්ෂ විසිහතරදාහස් තුන්සිය තිහයි ශත පනස් හය (රු. 6,47,24,330,56) ක මුදලක් 2014 පෙබරවාරි මස 11 වැනි දින වන විට කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී හයකෝටි හතලිස්හත්ලක්ෂ විසිහතරදාහස් තුන්සිය තිහයි ශත පනස් හය (රු. 6,47,24,330.56) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2014 පෙබරවාරි මස 12 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 12,205,027.99 ක මුදල මත 24% වැඩිදුරවාර්ෂික පොළිය සහ 37,768,612.89 ක මුදල මත 18% වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ද ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ ද යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 523, 5908 සහ 2656 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බෑන්ක් එෆ් සිලෝන් පී. එල්. සී හට උකස් කොට ඇත්තාවූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍ර කොළඹ 12, හල්ස්ඩොෆ් විදියේ අංක 182 හි 3 වන මහලේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන්හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4

දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ පානදුර නගර සභා සීමාවේ නල්ලුරුව ශ්‍රී ඥණරත්න මාවත දිගේ (කොට්ඨාස අංක 4 උයන්කැලේ) නල්ලුරුව (කොට්ඨාස අංක 5 මෝදරවිල) කළුදැවල (කොට්ඨාස අංක 5 මෝදරවිල) සහ වෑකඩ (කොට්ඨාස අංක 5 මෝදරවිල) පිහිටි මෝදරවිල අරමුණුගහවෙල කැටකැලගහවත්ත සහ අරමුණුගහකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර විසින් 1992 අගෝස්තු මස 14 වැනි දින සාදන ලද පිඹුරු අංක 939 හි ලොට් 15 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : එම පිඹුරේ ම ලොට් 14 ද, නැගෙනහිරට : එම් පිඹුරේ ම ලොට් 5 ද, දකුණට : එම පිඹුරේ ම ලොට් 19 ද, සහ බස්නාහිරට : එම පිඹුරේ ම ලොට් 14න් ද, මායිම් වූ එකී අංක 939 දරන පිඹුරු ප්‍රකාරව අක්කර එකයි පර්චස් දාහතයි දශම එකයි හය (අ. 1, රූ. 0, පර්. 17.16) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍ඉරු එෆ් 416/96 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම මතුපිටින් ගමන් කිරීමේ ඇති අයිතිය සමග වේ.

ඉහත සඳහන් ශ්‍රී ඥණරත්න මාවත දිගේ පිහිටා ඇති මෝදරවිල අරමුණුගහවෙල කැටකැලගහවත්ත සහ අරමුණුගහකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර විසින් 1992 අගෝස්තු මස 14 වැනි දින සාදන ලද පිඹුරු අංක 939 හි ලොට් 5 වශයෙන් සලකුනු කොට ඇති (පාරක් සඳහා වෙන්කරන ලද) ඉඩමට මායිම් වශයෙන් උතුරට : පිඹුරු අංක 935 හි ලොට් 20 ද, නැගෙනහිරට : ලොට් 6, 7, 8 සහ ඇල, ලොට් 17, 16, 18, 25, 26, 27, 36 සහ 38 ද දකුණට : ශ්‍රී ඥණරත්න මාවත ද, සහ බස්නාහිරට : ලොට් 39, 35, 28, 24, 19, 15, 14 සහ ඇල සහ ලොට් 10, 9, 4 සහ 3 ට මායිම් වූ කොටසට අක්කර එකයි පර්චස් තිස්පහයි දශම නමයයි එක (අ. 1, රූ. 0, පර්. 35.91) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍ඉරු එෆ් 257/53 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

04-388

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂනල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංක : 1593999.
පී. සී. හවුස් පී. එල්. සී.

2014 පෙබරවාරි මස 28 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. ඩී. රණගල විසින් සහතික කරන ලද 2010.11.26 වැනි දින අංක 1335 දරන හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. එස්. ජයවීර විසින් 2013.08.07 වැනි දින සහතික කරන ලද අංක 2246 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්, දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමින් වූ බැඳුම්කරයන් යටතේ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගමක් වන කොළඹ 03 ගාලු පාර අංක 451 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන පී. සී. හවුස් පී. එල්. සී. මින් පෙර පී. සී. හවුස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් එකොළොස් කෝටි විසි ලක්ෂ හතළිස් හතර දහස් එකසිය හතළිස් නවයක් (112,044,149.00)ක මුදලක් 2014 ජනවාරි මස 23 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එකොළොස් කෝටි විසි ලක්ෂ හතළිස් හතර දහස් එකසිය හතළිස් නවයක් (112,044,149.00) ක මුදල හා 2014.01.24 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 106,000,000 ක මුදලක් සඳහා වාර්ෂිකව AWPLR + 2.5% බැගින් වූ පොළිය ද, ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවාද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩු කර අයකර ගැනීම සඳහා එකී අංක 1335 සහ 2246 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී. වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර, මාවිල්මඩ, ලේවැල්ල පාර, දුටුගැමුණු මාවතේ, අංක 369/1 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාවන් තුළ අංක 257 මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහනුවර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ත්‍රිකුණාමල වීදියේ පිහිටි වරිපනම් අංක 134 සහ 136 දේපළට බලයලත් මානක එල්. ඩබ්. ආරියසේන විසින් 1966 පෙබරවාරි මස 02 වැනි දින සාදන ලද අංක 601 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, එනම් උතුරට : වරිපනම් අංක 138 දේපළෙන් ද, නැගෙනහිරට : පැවිලියන් භූමියෙන් ද, දකුණට : වරිපනම් අංක 132 දරන දේපලෙන් ද, හා බස්නාහිරට : ත්‍රිකුණාමල වීදියෙන් යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දාහතරයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 14.75) විශාල ඉඩම. මෙය මහනුවර ඉඩම් කාර්යාලයේ වෙලුම/පත්‍ඉරුව ඒ 367/213 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම මෑතක දී කරන ලද මැනුමකට අනුව පහත පරිදි විස්තර කර ඇත.

ඉහත කී අංක 257, මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, මහනුවර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ත්‍රිකුණාමල වීදියේ පිහිටි වරිපනම් අංක 134, 136 සහ 136/1 ත්‍රිකුණාමල වීදිය නමැති බෙදාවෙන් කළ ඉඩමට බලයලත් මානක ජී. ඩබ්. වීරකෝන් විසින් 2002 දෙසැම්බර් මස 11 වැනි දින සාදන ලද අංක 13060 දරන පිඹුරේ නිරූපිත ඉඩමට මායිම් (බලයලත් මානක එල්. ඩබ්. ආරියසේන විසින් 1966 පෙබරවාරි මස 02 වැනි දින සාදන ලද අංක 601 දරන පිඹුරේ නිරූපිත ඉඩමට මෑතකදී කරන ලද මැනුමක්) එනම් උතුරට : වරිපනම් අංක 138න් ද, නැගෙනහිරට : පැවිලියන් භූමියෙන් ද, දකුණට : වරිපනම් අංක 132න් ද හා බස්නාහිරට : ත්‍රිකුණාමල

විදියෙන් යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දාහතරයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 14.75) හෙක්ටයාර් 0.0373 විශාල ඉඩම.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

04-379

---

## මහජන බැංකුව - කඩුවෙල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29d) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013.10.25 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මහජන බැංකුවේ නමට කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රියන්ති ලියනගේ මහත්මිය විසින් 2003.03.13 දින සහතික කරන ලද උකස් ඔප්පු අංක 801, නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් වී. කේ. ගුණපාල මහත්මිය විසින් 2009.07.17 සහතික කරන ලද උකස් ඔප්පු අංක 232 සහ 2011.11.09 වැනි දින සහතික කරන ලද උකස් ඔප්පු අංක 2411 දරන උකස්කරයන් ප්‍රකාර ගෙවීම්, සිශාන් සර්විස් සෙන්ටර් (පුද්ගලික) සමාගම හා ඩී. එස්. ශාන්ත මයා, ජී. ඒ. ඩී. පී. බටුගහගේ මිය, බී. ඩී. ජී. සෂින්ද්‍රා මිය යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී බැඳුම්කර මත රුපියල් අනූ තුන් දහස් හත්සිය දාහතයි ශත තුනක් (රු. 93,717.03) මුදල ද, රුපියල් දාහත්ලක්ෂ දහනවදහස් තුන්සිය තිස් තුනයි ශත පනස් හයක (රු. 17,19,333.56) මුදල, රුපියල් විසි ලක්ෂය (රු. 20,00,000) සහ තිස්හය ලක්ෂ දහදහස් හාරසිය හතලිස් හතරයි ශත හතලිස් අටක (රු. 36,10,444.48) මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2013.02.23 දින සිට වර්ෂයකට 18.5% බැගින් රුපියල් අනූතුන් දහස් හත්සිය දාහතයි ශත තුනක (රු. 93,717.03) මුදලකට ද, 2013.12.02 දින සිට වර්ෂයකට 26.5% බැගින් රුපියල් දාහත් ලක්ෂ දහනව දහස් තුන්සිය තිස් තුනයි ශත පනස් හයක (රු. 17,19,333.56) මුදලකට හා 2012.12.31 දින සිට වර්ෂයකට 26.5% බැගින් රුපියල් විසි ලක්ෂයක (රු. 20,00,000) මුදලකට හා 2012.12.22 දින සිට වර්ෂයකට 18% බැගින් රුපියල් තිස්හය ලක්ෂ දහදහස් හාරසිය හතලිස් හතරයි ශත හතලිස් අටක (රු. 36,10,444.48) මුදලකට වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොලිය සහ අදාළ මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයකරගත යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් අනූතුන් දහස් හත්සිය දාහතයි ශත තුනක් (රු. 93,717.03) මුදල ද, රුපියල් දාහත්ලක්ෂ දහනවදහස් තුන්සිය තිස්තුනයි ශත පනස් හයක (රු. 17,19,333.56) මුදල හා රුපියල් විසි ලක්ෂයක (රු. 20,00,000) සහ තිස්හය ලක්ෂ දහදහස් හාරසිය හතලිස් හතරයි ශත හතලිස් අටක (රු. 36,10,444.48) මුදලක් ද අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එකී අංක 801, 232 හා 2411 දරන උකස් බැඳුම්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු බවට, 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ (වරිපනම් අංක 216, කඩුවෙල පාර) කොතලාවල යන ගම පිහිටි "දාඹුගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. තෙපුලන්ගොඩ මහතා විසින් 1998.12.24 වැනි දින මැන සාදන ලද අංක 506 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් අංක 3ඒ දරන කොටසට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු එම්. බී. ද සිල්වා මහතා විසින් 1948.12.19 දින මැන සාදන ලද අංක 6832 දරන පිඹුරේ ලොට් අංක එෆ් ද, නැගෙනහිරට : කඩුවෙල පාර ද, දකුණට : රාජසිංහ මාවත ද, බස්නාහිරට : පිඹුරු අංක 109 හි ලොට් අංක 02 ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 10.20) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේද වේ.

ඉහත කී ඉඩම පහත සඳහන් ඉඩම නැවත මැන සාදන ලද්දකි.

ඉහත කී කොතලාවල යන ගම පිහිටි "දාඹුගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. එම්. විජේරත්න මහතා විසින් 1992.12.05 වැනි දින මැන සාදන ලද අංක 109 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් අංක 03 දරන කොටසට මායිම්, උතරට : අංක 6832 දරන පිඹුරෙහි ලොට් අංක එෆ් ද, නැගෙනහිරට : කඩුවෙල මාලඹේ පාර ද, දකුණට : හේවාගම් පාර ද, බස්නාහිරට : මෙම පිඹුරේ සඳහන් කළ අංක 02 ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දොළහක් (අ. 0, රූ. 0, පර්. 12) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

මෙම උකස්කරය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 29/118 යටතේ ලියාපදිංචි වී ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
(කොළඹ පිටත).

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ පිටත, මහජන බැංකුව,
අංක 177ඒ, හයිලෙවල් පාර,
නුගේගොඩ.

04-380

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.